

# 16

# විශ්වාසය සුරකිමු

විශ්වයේ සාමය, සමගිය, ආදරය සහ අන්‍යෝන්‍ය අවබෝධය යනාදී ගුණාංග ස්ථිර ලෙස පවත්වා ගත යුතු නම් මිනිසුන් අතර යහගුණාංග සුරැකිය යුතු ය. සමාජයක හෝ රටක නැගුමට යහගුණාංග අත්‍යවශ්‍ය වේ. මන්දයත් යහගුණාංගයන්ගෙන් තොර වූ සමාජය පරාජිත වී විනාශය කරා ළඟා වෙමින් තිබෙන ආකාරය ඉතිහාසයේ දැකීමට හැකි ය. මෙහි අනතුරුදායක ප්‍රතිවිපාක මිනිසාට පමණක් නොව අනෙකුත් මැවීම්වලට ද බලපා ඇති බව අපි දකින්නෙමු. මිනිසාට යහගුණාංග හැදෑරීමට දේව මග පෙන්වීම අත්‍යවශ්‍ය වේ. එයත් සමඟ අධ්‍යාපනය ඔහු ජීවත් වන පරිසරය හා සමාජීය සිරිත් විරිත් යනාදිය ද ඊට උපකාරී වේ.

ඉස්ලාමය පවසන යහගුණාංග තුළ විශ්වාසවන්ත භාවය ඉතා වැදගත් ය. සෑම මිනිසකු තුළ ම අවංක භාවය, සත්‍ය භාවය විශ්වාසය මත භාරදුන් දෑ සුරැකීම යනාදී යහගුණාංග තිබීම අත්‍යවශ්‍ය ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ තම කුඩා වියේ පටන් විශ්වාසවන්ත භාවය සහ පොරොන්දු ඉටු කිරීම යනාදී යහගුණාංගවල අතිවිශිෂ්ටයකු ලෙස වැජඹුණහ. එම නිසා එතුමා අස් සාදික් (සත්‍යවන්තයා), අල් අමීන් (විශ්වාසවන්තයා) යනාදී නම්වලින් සියලු දෙනා අතර පිළිගැනීමට ලක් වූහ.

විශ්වාසවන්ත භාවයේ සලකුණු වන සත්‍යවාදී බව හා පොරොන්දු කඩ නොකිරීම පිළිබඳව අල් කුර්ආනය මෙසේ පවසා ඇත.

وَأَوْفُوا بِالْعَهْدِ إِنَّ الْعَهْدَ كَانَ مَسْئُولًا

**"තව ද නුඹලා පොරොන්දු ඉටු කරවු. සැබැවින් ම (නුඹලාගේ) පොරොන්දු විමසනු ලබන්නක් ය." (අල් කුර්ආන් 17 : 34)**

එලෙස ම තවත් තැනක,

يَا أَيُّهَا الَّذِينَ آمَنُواْ أَوْفُواْ بِالْعُقُود

**"විශ්වාස කළවුනි!, නුඹලා පොරොන්දු පරිපූර්ණව ඉටු කරවු! විශ්වාසවන්තයිනි! නියමිත ගිවිසුම එකහෙළාම පිළිපදිනු" යනුවෙන් සඳහන් වී ඇත.** *(5:1)*

කාලීන වශයෙන් මෙම ගුණාංග පිළිපැදීමේ ලා මිනිසාගේ තත්ත්වය පිළිබඳ ව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පවසන විට,

"නියත වශයෙන් ම ඔබගෙන් පසුව එක් ජන කොට්ඨාසයක් (පැමිණීමට) ඇත්තේ ය. ඔවුහු විශ්වාසය කඩ කරති. ඔවුන් වෙත කිසිදු දෙයක් භාර නොදිය යුතු ය. ඔවුහු සාක්කිකරුවන් වීමට තමන් විසින් ම ඉදිරිපත් වෙති. නමුත් සාක්කි දෙන ලෙස කිසිවකු ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නේ ද නැත. ඔවුහු භාර භාර වෙති, නමුත් ඒවා ඉටු නොකරති" යැයි පැවසූහ." (බුහාරි)

විශ්වාසවන්ත භාවය පිළිපැදීම මගින් තනි පුද්ගල, පවුල් සහ සමාජය යනාදී වශයෙන් සෑම පාර්ශ්වයක් අතර ම එකමුතුකම හා සබැඳියාව ඇති වී සහජීවනය තහවුරු වේ. හවුල් වශයෙන් කරනු ලබන ව්‍යාපාර කටයුතු සාර්ථක වන්නේ ය. ඒ සමඟ ම හවුල් ව්‍යාපාරයේ නියැලී සිටින්නන් තමන් අතර විශ්වාසවන්ත භාවය නොරැක අනෙකුත් හවුල්කරුවන්ට වංචා කිරීම මගින් හවුල් කටයුතු පරාජයෙන් අවසන්වනු දක්නට ලැබේ.

අල්ලාහු තආලා පවසන බව නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ මෙසේ පවසා ඇත්තාහ. "හවුල් ව්‍යාපාරයක නියැලී සිටින කෙනෙකු තමන්ගේ මිතුරාට වංචා නොකරන තාක් මම ඔවුන් සමඟ තුන්වන හවුල්කරුවා ලෙස සිටිමි. නමුත් ඔවුන්ගෙන් කෙනෙක් අනෙකාට වංචා කිරීමට පටන් ගතහොත් මම එම දෙදෙනා හැර දමා යමි" (අබූ දාවූද්)

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ මෙසේ පවසා ඇත්තාහ. "වංචා කරන්නා අවසාන දිනයේ දී (ඔහු කළ වංචනික ක්‍රියා හෙළි කිරීමට) කොඩියක් සිටුවනු ලැබ මේ අහවලාගේ පුත්‍රයා වන අහවලාගේ වංචාව (දක්වන කොඩිය වේ) යැයි පැවසේ." ( බුහාරි) යැයි කීවේ ය.

එක් අවස්ථාවක නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ වෙළඳ පොළක ආහාර ගොඩක් දැක එය තුළට තමාගේ අත දැමූහ. එතුමාගේ ඇඟිලිවලට තෙතමනය ගෑවිණි. එතුමා එම වෙළෙන්දා කැඳවා "කුමක් ද මේ?" කියා ඇසූහ. එයට ඔහු "අල්ලාහ්ගේ දූතයාණෙනි! වැහි වතුර මෙහි සැලුණා" යැයි කීවේ ය. එයට නබිතුමා "මිනිසුන්ට මේවා පෙනෙන්නට තබන්න තිබුණා නොවේ ද?" කියා අසා "කවරෙක් රවටයි ද ඔහු මාගේ සමාජයට අයත් කෙනෙකු නොවේ" යැයි පැවසූහ. (මුස්ලිම්)

**එම නිසා විශ්වාසවන්ත භාවය සහ සත්‍යවාදී බව ඇති අය ලෙස විශ්වාසය මත සුරැකිය යුතු දෑ සුරකිමින් දේව අණ පරිදි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ යහමාර්ගය අනුගමනය කර ජීවිතය හැඩ ගසා ගැනීමට උත්සාහ කරමු.**

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

الْأَمِيْنُ    الصَّادِقُ

**අභ්‍යාස**

1. විශ්වාසය, සත්‍යවාදී බව යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?
2. පොරොන්දු ඉටු කිරීම සම්බන්ධයෙන් වන අල් කුර්ආන් වැකියක් සඳහන් කරන්න.
3. "වංචා නොකළ යුතු යි" යන්නට නිදසුනක් දෙන්න.
4. විශ්වාසවන්ත භාවය හා සත්‍යවාදි බව හෙළි කෙරෙන ඔබ දන්නා සිද්ධියක් ලියන්න.